# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

# උපකුලපති තනතුර සඳහා අයදුම්පත් / නාමයෝජනා කැඳවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වන වගන්තියේ සහ එහි තදනන්තර සංශෝධනවල ද 2023 අප්‍රේල් මස 10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 03/2023 දරන චක්‍රලේඛයෙහි නියමයන් ප්‍රකාරව ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් 05-12-2024 වන දින සිට 31-12-2024 වෙනි දින තෙක් විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා පුද්ගලයින්ගෙන් අයදුම්පත් / නාමයෝජනා කැඳවනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අනුව උපකුලපති පූර්ණ කාලීන නිලධාරියෙක් වේ. ඔහු/ඇය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා හා ගණන්දීමේ නිලධාරියා වේ. ඔහු/ඇය නිල බලයෙන් පාලක සභාවේ හා සනාතන සභාවේ සාමාජිකයෙක් හා සභාපති ද වේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව උපකුලපති ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ කලින් ධූරය අත්හැර ගියහොත් හෝ වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අතර, ඔහු/ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ උපකුලපති තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකින් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතු වේ.

අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති සකස්කිරීම, මෙහෙයවීම හා හඳුන්වාදීම, පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හා විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් උපකුලපතිවරයා වගකිව යුතු බැවින් ඔහු/ඇය අධ්‍යයන විශිෂ්ටත්වය, පාරදෘශ්‍යභාවය, වගකීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල අපක්ෂපාති නායකත්ව මූලධර්ම උපස්ථම්භනය කරනු ලැබිය යුතු ය.

අපේක්ෂකයා ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, අයදුම්පත්‍ර බාර ගන්නා අවසන් දින වන විට වයස අවුරුදු 63 ට අඩු විය යුතු ය. ප්‍රබල පර්යේෂණ පැතිකඩක්, ප්‍රත්‍යක්ෂ නායකත්ව ගුණාංග හා විවිධ අභිරුචි කණ්ඩායම් සමඟ වාස්තවිකව ගනුදෙනු කළ හැකි අන්තර් පෞද්ගලික නිපුණතා, ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් හා තීරණ සඵල පරිදි ක්‍රියාත්මක කිරීමේ කැපවීම ඇතුළු උසස් ශාස්ත්‍රාලයීය ජයග්‍රහණ වාර්තාවක් සාර්ථක අපේක්ෂකයා සතුව තිබිය යුතු වේ. ප්‍රජාව කෙරෙහි ප්‍රයාපනය ඇතුළු විශ්වවිද්‍යාලයක ගුණාත්මකභාවය හා මෙහෙවර පිළිබඳව ගැඹුරු අවබෝධයක් ඔහු/ඇය වෙත තිබිය යුතු ය.

උපකුලපති විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩල වැටුප් පරිමාණයේ ඉහළම වැටුප් තලයේ තැබීමට හිමිකම් ලබන අතර, අදාළ වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක් සහ තනතුරට අදාළ අනෙකුත් දීමනා ලැබීමට හිමිකම් ලබයි.

අයදුම්පත්‍රය හෝ නාමයෝජනා පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතු වේ.

1. විශ්වවිද්‍යාලයේ සංවර්ධනය පිළිබඳ දැක්ම ප්‍රකාශයක්, පත් කරනු ලැබුවහොත් අපේක්ෂකයා / නාමිකයා අත්කර ගැනීමට යෝජනා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක් සහ උපන් දිනය ඇතුළුව අයදුම්කරුගේ / නම් කරන ලද තැනැත්තාගේ සම්පූර්ණ ජීව දත්ත. මෙයට අමතරව ඉහත ලේඛනවල මෘදු පිටපතක් සහ වෙනත් සහායක ලේඛන ඇතොත් ඒවායේ PDF ආකෘතින් ද registrar@wyb.ac.lk ඊ මේල් ලිපිනයට ඉදිරිපත් කළ යුතු ය.
2. වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු හෝ අයදුම්කරුවෙකු මීට පෙර විශ්වවිද්‍යාලයේ උපකුලපති ධූරය හෙබවූයේ නම්, ඔහු / ඇය ඉහත (1) ඡේදයේ සඳහන් ලියකියවිලිවලට අමතරව ඔහුගේ / ඇයගේ පූර්ව ධූර කාලය තුළ සිදුකරන ලද ජයග්‍රහණ ඉස්මතු කරන වාර්තාවක් ලබා දිය යුතුය. මෙයට අමතරව ඉහත ලේඛනවල මෘදු පිටපතක් සහ වෙනත් සහායක ලේඛන ඇතොත් ඒවායේ PDF ආකෘතින් ද registrar@wyb.ac.lk ඊ මේල් ලිපිනයට ඉදිරිපත් කළ යුතු ය.
3. නාමයෝජනා සම්බන්ධයෙන් නම් කරන ලද තැනැත්තාගේ කැමැත්ත සහිත ලිපියක්.
4. අයදුම්කරු / නාමිකයා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය හැර රාජ්‍ය සේවය, සමාගමක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම් අයදුම්කරු/නාමිකයා තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවායෝජකයාගෙන් ලිපියක්.

අයදුම්පත් / නාමයෝජනා, මුද්‍රා තැබූ කවරයක / ලියුම් කවරයක, "ලේඛකාධිකාරී, පාලක සභාවේ ලේකම්, ලේඛකාධිකාරී කාර්යාලය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය" යන ලිපිනයට 2024 දෙසැම්බර් මස 31 වන දින ප.ව. 3.00 ට පෙර භාරදීමට හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් ලැබීමට හැකි වන පරිදි එවීමට හැකි ය. අයදුම්පත්/ නාමයෝජනා ඇතුළත් ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරේ උපකුලපති තනතුර ලෙස සඳහන් කළ යුතු ය.

අදාළ අයදුම්පත් බාරගැනීමේ කාලය අවසන් වී මාස දෙකක කාලයක් ඇතුළත පාලක සභාවේ විශේෂ රැස්වීමක් කැඳවනු ලබන අතර, එම විශේෂ රැස්වීම වෙත අදාළ අයදුම්කරුවන් පෞද්ගලිකව කැඳවා ඇගයුම් කිරීම හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සිදුකරනු ඇත. මේ සම්බන්ධ විස්තර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවි සබැඳිය වෙත පිවිසීමෙන් ලබා ගත හැක. https://www.ugc.ac.lk/index.php?option=com_content&view=article&id=2442%3Acommission-circular-no-032023-appointment-to-the-post-of-vicechancellor&catid=190%3Acirculars-published-in-2023-01-2023-and-above&Itemid=20&lang=en. සුවිශේෂී තත්වයක් තුළ කිසියම් අපේක්ෂකයෙකුට පාලක සභාව ඉදිරියේ පෙනී සිටීමට හැකියාවක් නොමැති නම් ඔහුට / ඇයට වීඩියෝ සම්මන්ත්‍රණයක් හරහා සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවසර දිය හැකි ය.

පාලක සභාව විසින් කැඳවනු ලබන අපේක්ෂකයින් අවම වශයෙන් මිනිත්තු දහයක (10) නමුත් මිනිත්තු පහළොවක් (15) නොඉක්මවන කාල සීමාවක් තුළ කෙටි ඉදිරිපත් කිරීමක් සඳහා පැමිණිය යුතු ය.

අපේක්ෂකයින්ගේ නම් තුනක් නිර්දේශ කරමින් විශේෂ පාලක සභා රැස්වීමේ වාර්තාව සකස් කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2023 හි දක්වා ඇති සියලුම ලියකියවිලි සමඟ වැඩිදුර කටයුතු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් / නාමයෝජනා සලකා නොබලන බව දන්වා සිටිමි.

**ලේඛකාධිකාරී / පාලක සභාවේ ලේකම්**
**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය**
**කුලියාපිටිය**

**2024-12-05**